සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයෙහි කාර්මික නිලධාරි (සිවිල්/ විදුලි/ යාන්ත්‍රික/ ප්‍රමාණ සමීක්ෂණ)

තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය
යොමු අංකය : CSE/20A පොදු දිනය :2019.04.24

1.2 අමාත්‍යාංශය : සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය
යොමු අංකය : DCSPT/09/P2/07/SLTS/01 දිනය : 2019.04.24

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : දිනය :

1.4 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය
යොමු අංකය : දිනය :

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : දිනය :

1.6 සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : PPSC/ES/06/FI/01 දිනය : 2019.04.26

**02. පත් කිරීම් බලධාරියා** : සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික
අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපත්තිය

3.2 ශ්‍රේණි : පුහුණු කිරීමේ ශ්‍රේණිය , III, II, I හා විශේෂ ශ්‍රේණිය

**04. පැවරෙන කාර්යය පිළිබඳ පොදු නිර්වචනය :**

විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳව පුහුණුව ලබා ගත යුතු, ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ මූල්‍ය, මානව, භෞතික, ද්‍රව්‍යමය, තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය, මෙහෙයවීම හා කළමනාකාරිත්වය යන කාර්යයන් ඇතුළත් බහුකාර්යය ස්වරූපයෙන් යුත් අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත කළමනාකරණ සේවා වන ඉංජිනේරු, විද්‍යාත්මක, කෘෂිකර්ම සහ සත්ත්ව නිෂ්පාදන වැනි වෘත්තිමය සේවාවන්ට පරිපූරක වන්නා වූ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

4.1 **කාර්යයන් පැවරීම** :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

යොමු අංකය :- CS/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : III, II, I ශ්‍රේණි - (MN-3-2016)

විශේෂ ශ්‍රේණිය - (MN-7-2016)

5.2 වැටුප් පරිමාණය : III, II, I ශ්‍රේණි රු.31,040-10x445-11x660-10x730-10x750-57,550*

විශේෂ ශ්‍රේණිය - 41,580-11x755-18x1030- 68,425*

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | 01 පියවර | 31,040* |
| II | 12 පියවර | 36,150* |
| I | 23 පියවර | 43,480* |
| විශේෂ | 04 පියවර | 43,845* |

සටහන - *2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපලේඛන i අනුව ඉහත වැටුප් පරිමාණය 2016.01.01 දින සිට අදියර 05කින් උපලේඛණ ii හි සඳහන් පරිදි ක්‍රියාත්මක කෙරෙන අතර මෙම වැටුප් පරිමාණයට එලඹෙන්නේ 2020 වසරේදීය. රජය මගින් කලින් කලට කරනු ලබන සංශෝධනයන්ට ද යටත් වේ.

5.4 පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනාව : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව

1 වසර - රු.24,336/-

2 වසර - රු.24,605/-

## 06. සේවා ගණයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| | | | උපලේඛන 01 |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III,II, I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ. ඉන් පරිබාහිරව විශේෂ ශ්‍රේණිය සඳහා සේවා අවශ්‍යතාවය අනුව අනුමත සේවක සංඛ්‍යාවක් වෙනම පැවතිය හැකිය. තනතුරු සංඛ්‍යාව :- 257

යොමු අංකය :- GS/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

6.3 තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ |

සටහන :

I. III, II, I යන ශ්‍රේණින්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් සබරගමුව පළාත් සභාවේ දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ තුල නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03ට අඩු නම් බඳවාගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2 විවෘත බඳවා ගැනීම :

**7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය**

**7.2.1.1 පුහුණු කිරීමේ ශ්‍රේණිය : (දෙවසරක පුහුණු කාලය)**

(අ) අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සහිතව ගණිතය / ඉංග්‍රීසි / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් 01ක් සහිතව විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

සහ

මව්බස (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව), විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**7.2.1.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය)**

(අ) අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

හෝ

යොමු අංකය :- ගස/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සහිතව ගණිතය / ඉංග්‍රීසි / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් 01ක් සහිතව විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

සහ

මව්බස (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම්:

i. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම.
(උදා: ජාතික තාක්ෂණ සහතිකය සිවිල්/විදුලි/යාන්ත්‍රික/ප්‍රමාණ සමීක්ෂණ)
හෝ

ii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම
හෝ

යොමු අංකය :- ගස/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

iii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම.

සටහන : (i) III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III ශ්‍රේණියට පළමුව බඳවා ගත යුතුය.

(ii) III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කරගනු ලැබේ.

**7.2.1.3 III වන ශ්‍රේණිය**

(අ) අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සහිතව ගණිතය / ඉංග්‍රීසි / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් 01ක් සහිතව විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

සහ

මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව), විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තිය සුදුසුකම්

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව
හෝ
II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව
හෝ
III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශ විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව
හෝ
IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව
හෝ
V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම
හෝ
VI. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තිය කුසලතා (NVQ 6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

සටහන :

(i) අයදුම් කරනු ලබන ක්ෂේත්‍රයට අදාලව තාක්ෂණ ඩිප්ලෝමාව ලබා තිබීම අනිවාර්ය වේ. උදා: අයදුම් කරනු ලබන්නේ කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට නම් ඊට අදාළව ද, කාර්මික නිලධාරි (යාන්ත්‍රික) නම් ඊට අදාළව ද ආදි වශයෙන් තාක්ෂණ ඩිප්ලෝමාව ලබා තිබිය යුතුය.

යොමු අංකය :- ආස/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

**7.2.2. කායික සුදුසුකම් :**

සබරගමුව පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

යොමු අංකය :- අS/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇත. බව සහතික කරමි.
ආණ්ඩුකාරවරයාගේ ලේකම්, සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

**7.2.3. වෙනත් :**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.
IV. අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුල ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුල අයදුම්කරුව සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරු ගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය සබරගමුව පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**7.2.4. වයස :**

7.2.4.1. අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු
7.2.4.2. උපරිම සීමාව : අවුරුදු 30ට නොවැඩි

**7.2.5 බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත විභාගය : ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් විසින් ලබාගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය අනුව රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 15/90හි සඳහන් අනෙකුත් විධිවිධාන අනුගමනය කරමින් දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත හා දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල පදනම් කර ගනිමින් පවතින පුරප්පාඩු ගණනට සමාන පිරිසක් බඳවාගනු ලැබේ.

**7.2.5.1. ලිඛිත විභාගය**

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% | උපලේඛන 02 හි දක්වා ඇත |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40% | |

**7.2.5.1.1 පවත්වන බලධාරියා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

**7.2.5.2 වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ.

**7.2.5.3.සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය** : ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - ලකුණු ලබා නොදෙන අතර කායික යෝග්‍යතාවය හා සුදුසුකම් වලට අදාළ සහතික පරීක්ෂා කිරීම පමණක් සිදුකෙරේ.

**7.2.5.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා** : සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**7.2.5.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** : අදාළ නොවේ.

**7.2.6 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : පුවත්පත් දැන්වීමක් මගින් හෝ සබරගමුව පළාත් සභා වෙබ් අඩවියේ හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් හෝ අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 සීමිත බඳවා ගැනීම**

**7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :**

**7.3.1.1 පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)**

(අ) අධ්‍යාපන සුදුසුකම් : මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව), විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) පළපුරුද්ද : ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**7.3.1.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා)**

(අ) අධ්‍යාපන සුදුසුකම් :

මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව), විද්‍යාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

තනතුරට අදාළ 7.2.1.2 (ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකමක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් තිබීම.

(ඇ) පළපුරුද්ද :

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**7.3.1.3 III වන ශ්‍රේණිය**

(අ) අධ්‍යාපන සුදුසුකම් :

මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව), විද්‍යාව, ගණිතය යන විෂයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

තනතුරට අදාළ 7.2.1.3 (ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

(ඇ) පළපුරුද්ද :

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

යොමු අංකය :- ගස/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

7

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:- 2019.05.17

7.3.2. කායික සුදුසුකම් :

සබරගමුව පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.3. වෙනත්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

II. නියමිත දිනට පූර්වාසන්නව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම .

III. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.3.4.1. ලිඛිත විභාගය

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% | උපලේඛන 02 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40% | |

7.3.4.1.1 පවත්වන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - ලකුණු ලබා නොදෙන අතර කායික යෝග්‍යතාවය හා සුදුසුකම් වලට අදාළ සහතික පරීක්ෂා කිරීම පමණක් සිදුකෙරේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා:

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

යොමු අංකය :- සප/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.5 පුහුණු කාල සීමාව අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගැනීම.

(අ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. (පුහුණුව අවසානයේ පිළිගත හැකි සහතිකයක් අදාළ පුහුණු කිරීමේ ආයතනය විසින් නිකුත් කළ යුතුය.)

(ආ) පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කල ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලබන අතර සීමිත ධාරාව යටතේ අයදුම්කල ආධුනිකයින් ඔවුන්ගේ පූර්ව තනතුරුවලට මුදාහැරේ.

(ඇ) දෙවසරකට වඩා වැඩි පුහුණුවක් අවශ්‍ය යම් විශේෂ තනතුරු වෙතොත් විභාගය සමත් වූ පසු එම අතිරේක පුහුණු කාලයක් සඳහා අතිරේක පුහුණු කාලයේ එක් වසරක් වෙනුවෙන් එක් වැටුප් වර්ධකයක් බැගින් ලබාදීමේ පදනම මත පුහුණුව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, අතිරේක පුහුණු කාල සීමාව II ශ්‍රේණියට උසස් කිරීම සඳහා සළකා බලනු ලබන කාල සීමාවට ගණන් ගනු ලැබේ.

(ඈ) සීමිත ධාරාව යටතේ තෝරාගත් ආධුනිකයන් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වන විභාගය සමත්වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු කාල සීමාව සතුටුදායක ලෙස ගතකරන නිලධාරියෙකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත්වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 07/2000 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

යොමු අංකය :- ගS/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

08. **කාර්යක්ෂමතා කඩඉම් විභාගය :**

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වාභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| I කාර්යක්ෂමතා කඩඉම | සබරගමුව පළාතේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛනය 03 ) |
| II කාර්යක්ෂමතා කඩඉම | සබරගමුව පළාතේ තාක්ෂණ සේවයේ II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛනය 04 ) |
| III කාර්යක්ෂමතා කඩඉම | සබරගමුව පළාතේ තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර | කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද?

වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන බලධරයින් කවුරුන් ද?

(අ) 1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම :

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබයි.

(ආ) 3 වන කාර්යක්ෂමතා කඩඉම :

යොමු අංකය :- ගs/Es/13/3/30 සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.14 දින අනුමත කර ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි.

සටහන:

- මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) සම්පූර්ණ කර ඇති නිලධරයන් III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

09. **භාෂා ප්‍රවීණතාව**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීනතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුලදී ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අ.පො.ස. ( සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් III ශ්‍රේණියේ වසර 05 ක් ඉක්මවීමට පෙර ලබා ගත යුතුය. |

## 10 . ශ්‍රේණි උසස් කිරීම

### 10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළදී සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

V. 9 ජේදයේ සඳහන් පරිදි අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවයන් ලබාගෙන තිබීම

VI. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

**10.1.1.2 උසස් කිරීම් ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II වන ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

### 10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

යොමු අංකය :- GS/ES/1/3/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019 .05. 14.....දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීමේ බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

සටහන : සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදි නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධරයන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

### 10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (බඳවා ගැනීම)

10.3.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| සීමිත තරඟ විභාගයෙන් | අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතාවය | අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 60% |

සටහන :

- විශේෂ ශ්‍රේණියේ බඳවා ගැනීමේ දී පුරප්පාඩු ගණනය කල යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

I. අනුමත තනතුරු සංඛ්‍යාව 04ක් වන විට සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 75%ක් විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03ක් වන විට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 66.67%ක් විය යුතුය.

II. විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 03කට වඩා අඩු වේ නම්, නිලධාරින්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත තනතුරු වල පුරප්පාඩු පිරවීම සිදුකළ යුතුය.

10.3.2 සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගැනීම

10.3.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN 3) සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහම (05) නියමිත දිනට උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම.

යොමු අංකය :- ගS/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

දිනය:- 2019.05.17
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

**10.3.2.2 බඳවා ගන්නා ආකාරය**

පත්වීම් බලධරයා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලබයි.

(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - උපලේඛණ අංක 05)

සටහන :

i. විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අදාළ කරගත යුතු වන්නේ එම විභාගය අදාළ වන්නා වූ වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

ii. වාර්ෂිකව එම විභාගය පැවැත්වීමට නොහැකි වූයේ නම් ඊට පසු වර්ෂයක පැවැත්වෙන විභාගයක ප්‍රතිඵල එක් එක් වර්ෂවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අදාළ කරගනු ලැබේ. එහිදී ඒ ඒ වර්ෂ වල පුරප්පාඩු ඇති වූ දිනයන්ට සුදුසුකම් ලැබූ නිලධරයන් ලකුණු අනුපිළිවෙල අනුව තෝරා ගනු ලබන අතර විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදුකරන දිනය ලෙස සලකනුයේ එම විභාගය පැවැත්වූ දිනය වේ.

**10.3.3 සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගැනීම**

10.3.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN 3) සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හයක (06) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) නියමිත දිනට උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හයක් (06) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම

**10.3.3.2 බඳවා ගන්නා ආකාරය**

පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂාකර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලබයි.

(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - උපලේඛන අංක 06)

යොමු අංකය :- ගS/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14......දින අනුමත කර ඇති බව
සහතික කරමි.

දිනය:- 2019.05.17 ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

**11.** තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

**12.** ක්‍රියාත්මක වන දිනය : මෙම බඳවා ගැනීමේ පරිපාටිය ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.06.01 දින සිට ක්‍රියාත්මක වේ.

**13.** අර්ථ නිරූපන හා නිර්වචන

13.1. "බඳවා ගැනීමේ පරිපාටිය"යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි කාර්මික නිළධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියයි.

13.2. "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා/තුමිය වේ.

13.3. "කොමිෂන් සභාව"යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.4. "ප්‍රධාන ලේකම්"යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වේ.

13.5. "ලේකම්"යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

13.6. "ආධුනික නිලධාරියා" යනුවෙන් අදහස් කරනුයේ මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන යටතේ බඳවා ගනු ලැබූ පුහුණු කිරීමේ ශ්‍රේණියේ සිටින පුද්ගලයෙකු වේ.

13.7."දෙපාර්තමේන්තු ප්‍රධානියා"යනුවෙන් අදහස් කරනුයේ සබරගමුව පළාත් ඉංජිනේරු සේවාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වේ.

13.8."සතුටුදායක සේවා කාලය"යනුවෙන් අදහස් කරනුයේ, රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුලදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දාවූ කාල සීමාවක් වන්නේය.

13.9. "සක්‍රිය සේවා කාලය"යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, සබරගමුව පළාත් සභා මූල්‍ය රීති සහ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවාගැනීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වන අවසාන තීරණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලැබේ.

යොමු අංකය :- SG/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:- 2019.05.17 සබරගමුව පළාත.

## 16. පරිවාස කාලය හා සේවය ස්ථිර කිරීම

I. විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරියෙකු වසර 03 ක පරිවාස කාලයට අයත් වේ. ඔහු/ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව ඇත්නම් හා පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ.

II. සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත III වන ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් වසරක වැඩ බැලීමේ කාලයට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ ඇය වැඩ බැලීමේ කාලය තුල සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම්, වැඩ බැලීමේ කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ.

## 17. අන්තර්ග්‍රහණ විධිවිධාන

I. මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති MN-3-2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධරයන් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරණු ලැබේ.

II. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. අන්තර්ග්‍රණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූප වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

17.1 මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට සේවයේ නියුතු නිලධරයන් නව බඳවා ගැනීමේ පරිපාටිය යටතේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම පහත සඳහන් ආකාරයට සිදු කරනු ලැබේ.

17.1.1 සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ "II පන්තිය 'ආ' ඛණ්ඩයේ" සිටින නිලධරයන්.

17.1.2 සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ " II පන්තිය 'අ' ඛණ්ඩයේ" සිටින නිලධරයන්.

යොමු අංකය :- ශඝ/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 .........දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

17.1.3 සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ "I පන්තියේ" සිටින නිලධරයන්.

17.1.4 සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ සිටින නිලධරයන්.

18. අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන 2018.06.01 දක්වා බලපැවැත්වේ. මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට III වන හා II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ට උසස්වීම් ලබා දීමේ දී අන්තර් කාලය තුළදී අදාළ කරගත යුත්තේ 2006.01.06 දිනැති අංක 1426/34 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව සකස් කර 2005.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමතව ඇති සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.1 (අ) සහ 7.2 (අ) වගන්තිය වේ. (මෙම අන්තර්කාලීන විධිවිධාන අදාළ වන්නේ බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති 2005.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමතව ඇති සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා බඳවාගැනීමේ පරිපාටිය යටතේ බඳවා ගත් නිලධරයන්ට පමණි. (අනෙකුත් කොන්දේසි නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව වේ.)

සකස් කළේ : අත්සන :- ........................................ (signature) M.D. සමරා සංවර්ධන නිලධාරී

(විෂය භාර නිලධාරී)

පරීක්ෂා කළේ :- ........................................ (signature)

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

ඉංජි. පී. එල්. විජයානි රත්නායක
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මාර්ග) - රත්නපුර,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි. සේවා) කාර්යාලය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

යොමු අංකය: CSE/20A

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයෙ හි සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයෙහි කාර්මික නිලධාරි (සිවිල්/ විදුලි/යාන්ත්‍රික/ප්‍රමාණ සමීක්ෂණ) යෝජිත බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

යොමු අංකය :- සභා/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:- 2019.05.17

අත්සන:........................................ (signature)

නම:........................................

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)

සබරගමුව පළාත් සභාව

ඉංජි. අජිත් පනාගොඩ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

නිල මුද්‍රව :........................................

දිනය: 2019/04/24

යොමු අංකය : DCSPT/09/P2/07/SLTS/01

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ හි සබරගමුව පළාත්සභා [illegible] සේවයේ තාක්ෂණ සේවයේ අයිත්කර කළ සහකාර තාක්ෂණ සේවා තනතුරේ යෝජිත බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.
කාර්මික නිලධාරී (සිවිල්/විදුලි/යාන්ත්‍රික/ප්‍රමාණ සමීක්ෂණ)

අත්සන:..........................................................

නම:..........................................................

ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත් සභාව.

ඩී. එම්. මාලනී
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

නිල මුද්‍රව :..........................................................

දිනය: 2019.04.29

යොමු අංකය : PPSC/ES/06/PI/01

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ හි තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්/විදුලි/යාන්ත්‍රික/ප්‍රමාණ සමීක්ෂණ) බඳවා ගැනීමේ පරිපාටිය 2019.04.26
දින සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

අත්සන:..........................................................

නම: සුනේත්‍රා ගුණවර්ධන

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත් සභාව.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත,
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

නිල මුද්‍රව :..........................................................

දිනය: 2019.04.29

යොමු අංකය:..........................................................

.......................................................... හි ..........................................................

..........................................................බඳවා ගැනීමේ

පරිපාටිය .......................... දින සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

යොමු අංකය :- ආඩ/ES/13/3/30
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.14 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවරයාගේ ලේකම්,
සබරගමුව පළාත.
දිනය:- 2019.05.17

අත්සන:..........................................................

නම:..........................................................

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත් සභාව.

